ජාතික පොලිස් කොමිෂන් සභාව
தேசிய பொலிஸ் ஆணைக்குழு
National Police Commission
අංක 9 ගොඩනැගිල්ල, B.M.I.C.H. පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ 0
9 ஆம் இலக்கக் கட்டிடம், B.M.I.C.H. வளாகம், பௌத்தாலோக மாவத்தை, கொழும்பு 0
Block No. 9, B.M.I.C.H. Premises, Bauddhaloka Mawatha, Colombo 0

මගේ අංකය / எனது இல. / My No. NPC/ED/01/04/NGO(SI)-SOR
ඔබේ අංකය / உமது இல. / Your No. 02/24/05/02/2025
දිනය / திகதி / Date 2026.03. 16

ලේකම්
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් හා නියාමන සේවා ගණය සඳහා වන සංශෝධිත බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය (උප පොලිස් පරීක්ෂක) සම්බන්ධයෙන් නැවත සංශෝධන අනුමත කරවා ගැනීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් යොමු කරන ලද අංක 02/24/05/02/2025 හා 2026.02.24 වන දිනැති ලිපිය හා බැඳේ.

02. ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් හා නියාමන සේවා ගණය සඳහා වන සංශෝධිත බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට (උප පොලිස් පරීක්ෂක) මේ සමග අමුණා ඇති ඇමුණුමේ සඳහන් සංශෝධන ඇතුළත් කර ගැනීමට 2026.03.04 වන දින රැස් වූ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

03. තවද, එම බඳවාගැනීම් පටිපාටිය ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් විසින් 2026.01.22 වන දින සහතික කර ඇති බැවින් නැවත සහතික කිරීමක් අවශ්‍ය නොවන අතර, ජාතික පොලිස් කොමිෂන් සභාව මගින් සිදු කරන ලද සංශෝධනය සටහන් කර ගැනීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

තනුජා එන්. ප්‍රනාන්දු
ලේකම්
ජාතික පොලිස් කොමිෂන් සභාව

පිටපත : පොලිස්පති, පොලිස් මූලස්ථානය - ඔබගේ අංක PHQ/EP &SORP/10/06/2025 හා 2026.02.18 දිනැති ලිපිය සම්බන්ධයෙන් කරු. දැ.ගැ.ස. සහ ලිපියේ සඳහන් සංශෝධනයන් පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමට හා ඒ සඳහා නිකුත් කරන ලද ආර්.ටී.එම්. පණිවිඩයේ පිටපතක් ජාතික පොලිස් කොමිෂන් සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලෙස.

ක්ෂණික ඇමතුම්/உடன் தொடர்பு/Hot Line : **1960 / 0710361010**
දුරකථන අංකය / தொலைபேசி / Telephone No. 011 2166500
ෆැක්ස් / தொலைநகல் / Fax 011 2166555
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail info@npc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site www.npc.gov.lk

ඇමුණුම

**ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් හා නියාමන සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය (උප පොලිස් පරීක්ෂක) සංශෝධන ලැයිස්තුව.**

| අනු අංකය | ඡේද අංකය | යෝජිත සංශෝධනය |
|---|---|---|
| 01 | 7.2 | **විවෘත බඳවා ගැනීම** |
| | 7.2.2.1 | අධ්‍යාපන සුදුසුකම් :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව, සිංහල/දෙමළ භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් පහක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 කින් එකවර සමත්වීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයන් තුනකින් සමත් වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර). |
| 02 | 7.2.2.5 | වෙනත්. |
| | iii. | අවිවාහක විය යුතුය.<br>(දික්කසාද වූවන්, වැන්දඹුවන්, ගර්භණීව සිටීම සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි.) |
| 03 | 7.2.4.5. | **පසුබිම් පරීක්ෂණය:** |
| | 7.2.4.5.1. | ලිඛිත විභාගයෙන් සහ යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කරුවන් ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කර ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඉන් අනතුරුව පවතින පුරප්පාඩු ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ වන තෙක් අවශ්‍ය අයදුම්කරුවන් ප්‍රමාණයක් පසුබිම් පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. |
| | 7.2.4.5.2. | අයදුම්කරුවන්ගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඔහු/ඇය හා ඔහුගේ/ ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු/ ඇය සමීපව ඇසුරු කරන්නන්ගේ ද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව අයදුම්කරු පදිංචි පොලිස් ස්ථානය, පොලිස් විශේෂ කාර්යාංශය හා රාජ්‍ය බුද්ධි සේවය මගින් පසුබිම් පරීක්ෂණ වාර්තා කැඳවනු ලබන අතර, එහි දී අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් නුසුදුස්සන් සේ සලකනු ලැබේ |
| 04 | 7.2.4.6. | **වෛද්‍ය පරීක්ෂණ** |
| | 7.2.4.6.1. | |
| | I. | වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන් විසින් පොදු 169 පෝර්මය සම්පූර්ණ කර පොලිස් රෝහල වෙත ඉදිරිපත් කළ යුතුය. |
| | II. | මෙහි දී අයදුම්කරුවන් පොලිස් රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු බවට සහ ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය කරනු ලැබේ. |
| | III | එම අයදුම්කරුවන් / අයදුම්කාරියන් පොලිස් රෝහල විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්විය යුතුය. (ඇමුණුම VI අනුව) |
| | IV | ඉහත II හා III හි සඳහන් පරීක්ෂණවලින් සමත්ව බඳවාගැනීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වී ඇත්ද යන්න හඳුනාගැනීමේ වෛද්‍ය පරීක්ෂණය සඳහා පොලිස් රෝහල මගින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත යොමු කර වෛද්‍ය වාර්තාවක් කැඳවනු ලැබේ. |
| | V | සෞඛ්‍ය 169 පෝර්මය, ඇමුණුම VI වෛද්‍ය වාර්තාව හා ඉහත IV හි සඳහන් පරිදි අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් ලබාගන්නා වාර්තාව අනුව යෝග්‍යතාවය තහවුරු කරන අයදුම්කරුවන් පමණක් පවතින පුරප්පාඩු මත බඳවාගැනීම සඳහා සලකා බලනු ලැබේ. |
| | VI | වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි. |